**ශීර්ෂය - 439 බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය. අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 23දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කරන ලද නව අමාත්‍යාංශයක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත්අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා රාජ්‍ය ව්‍යවසායන් විසින් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට හර කිරීම් ලෙස අක් මුදල් ගැලපුම් ගිණුමේ රු.169,001,318 ක් දක්වා තිබුණද, මූල්‍ය ප්‍රකාශන වල සටහන් ACA 2 (ii) හි එය රු.168,755,856 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.245,464 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන සටහන් ACA 2(ii) හි රු 245,464 මුදල් පොතට අනුව වියදම ලෙස සටහන් වීමෙන් මෙම වරද සිදු වී ඇති අතර මුදල් රෙගුලාසි 208 යටතේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් ශේෂය ද රු169,001,318 ලෙස නිවැරදි විය යුතු බව. | මුදල්රෙගුලාසි 208 යටතේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් නිවැරදිව ගිණුම් ගත කල යුතුවේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්තා කිරීමේ පදනම ඇතුළත් සටහන් අනාවරණය කර නොතිබුණි. | ඉදිරි වර්ෂවල දී මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේදී සටහන් කරන බව. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කල යුතුවේ. |

### 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 427 (2) ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධව භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.3,061,402 ක් වූ අතර, අමාත්‍යාංශ කේවල ගිණුම් අනුව ශේෂය රු.3,142,936 ක් වූයෙන් ඒ අතර රු.81,534 ක වෙනසක් විය. එම වෙනසට හේතු ගිණුම තුළ අනාවරණය කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිරවුල් කර ඇති බව | වෙනසට හේතුන් සැසඳීම් ප්‍රකාශ මඟින් ඉදිරිපත් කල යුතුවේ. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) පුද්ගල පඩිනඩි ලේඛනය**<br>මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා නොතිබුණි | නිලධාරී හිඟය කාර්ය මණ්ඩලයේ නොදැනුවත්භාවය හා නුපුහුණු වීම මත එම ලේඛන යාවත්කාලීන කරමින් ක්‍රමවත්ව නඩත්තු කිරීමට නොහැකි වූ බව හා මේ වන විට යාවත්කාලීන කොට අඩු පාඩු නිවැරදි කරමින් පවතින බව | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව නියමිත ආකෘතිය පරිදි පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා ගත යුතුවේ. |
| **(ආ) විගණන විමසුම් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 452(1) ප්‍රකාර විගණන විමසුම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 452(1) ප්‍රකාර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගත යුතුවේ. |
| **(ඇ) දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය**<br>මුදල් රෙගුලාසි 447 ප්‍රකාර දෙපාර්තමේන්තු විසින් විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලින කර නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝර්මය අනුව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් පවත්වා ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **ණය සහ අත්තිකාරම් ලේඛනය**<br>2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. | -එම- | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුවේ. |
| (ඉ) | **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි | -එම- | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුවේ.. |
| (ඊ) | **බැරකම් පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි | -එම- | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කල යුතුවේ. |

**1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------ | ------------- |
| භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ වල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ සාරාංශ වාර්තා (SA 80) යටතට ඇතුළත් වන පරිදි වර්ෂය තුළ මිලදි ගත් වත්කම් පිළිබඳ තොරතුරු භාණ්ඩාගාරය වෙත වාර්තා කර නොතිබීම හේතුවෙන් භාණ්ඩාගාර මුද්‍රිත, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ සාරාංශ වාර්තාවෙහි (SA 80) කිසිදු තොරතුරක් ඇතුළත් වී නොතිබුණි.. | 2020 වර්ෂයේ මිලදී ගත් වත්කම් එම වර්ෂයේ භාණ්ඩාගාරය වෙත වාර්තා කර නොතිබූ බවත්, 2021 වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගිණුම් ගත කරමින් එය නිවැරදි කල බව | වර්ෂය තුළ මිලදි ගත් වත්කම් පිළිබඳ භාණ්ඩාගාරය වෙත වාර්තා කල යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේනිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව 2021 වර්ෂයේ දරන ලද එකතුව රු 933,988 ක වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | රු 933,988ක් වූ වියදම් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට හඳුනා ගැනීමට නොහැකි වූ හෙයින් බැරකම් ලෙස වර්තා කිරීමට නොහැකිවූ බව | බැදීම් ප්‍රකාශයෙහි වර්ෂයට අදාල සියළුම බැරකම් ඇතුලත් කල යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.3,892,515 ක් වූ බැරකම් සඳහා එළඹ තිබුණද, එම වටිනාකම භාණ්ඩාගාරය වෙත වාර්තා නොකිරීම හේතුවෙන්භාණ්ඩාගාරයේ මාසික බැරකම් / සංචිත සාරාංශ වාර්තාවේහි (SA 90) කිසිදු තොරතුරක් ඇතුළත් වී නොතිබුණි. | මෙම අමාත්‍යාංශයේ 2020 වර්ෂයේ බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොතිබු හෙයින් මෙය සිදුවී ඇති බව. | එළඹෙන ලද සියළුම බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කලයුතුවේ.. |

### 2.2 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 65 අනුව විසර්ජන පනත සමඟ පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන වාර්ෂික වියදම් ඇස්තමේන්තු සහ පාර්ලිමේන්තුව මඟින් සම්මතවූ යෝජනාවලින් නිශ්චිත කාර්යයන් සඳහා ප්‍රතිපාදනය කරන ලද මුදල් නිසි අධිකාරීබලය නොමැතිව වෙනස් නොකලයුතු වුවත්, වැයවිෂයඅංක 439-2-3-4-2202 හා 439-2-3-5-2202 යටතේ අත්යන්ත්‍ර,ඇඟළුම් හා ඇඟළුම් ආශ්‍රිත කුඩා පරිමාණ කර්මාන්තශාලා මඟින් කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා සංවර්ධන සහයන් ලෙස රු.83,200,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදිත මුදලින් අමාත්‍යාංශයේ භාවිතය සඳහා රු.726,580 ක් වූ ස්ථාවර වත්කම් මිලදිගෙන තිබුණි. | මෙම ව්‍යාපෘති වල ඉතිරි වූ මුදල වෙනත් ව්‍යාපෘතියකට යෙදවීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීමත් උපකරන මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ වැය ශීර්ෂයට ප්‍රමාණවත් මුදලක් වෙන් නොවීමත් සහ මෙම උපකරණ වල හිගයක් පැවතීමත් සැලකිල්ලට ගෙන ස්ථාවර වත්කම් මිලදී ගත් බව හා උපකරණ නියමිත පරිදි ඉන්වෙන්ට්‍රි ගතකර දැනට කාර්යාල කටයුතු සඳහා භාවිතා කරන බව. | පාර්ලිමේන්තුවමඟින් සම්මතවූ යෝජනාවලින් නිශ්චිත කාර්යයන් සඳහා ප්‍රතිපාදනය කරනලද මුදල් නිසි අධිකාරීබලය නොමැතිවවෙනස් නොකල යුතුවේ. |

## 2.3 වියදම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වැය විෂය අංක 2102 හා 2103 යටතේ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ප්‍රතිපාදිත මුදල රු.1,480,000 ක් වුවත්, වර්ෂය තුළදී රු.2,368,130 ක වත්කම් මිලදිගෙන තිබූණෙන් එම සීමාව ඉක්මවා රු.888,130 ක වියදම් දරා තිබුණි. මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවේ 6112202 හා 6112204 කේතයන් යටතේ ඇතුළත් කර තිබූ රු.2,100,000 ක් වටිනා වත්කම් පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කර තිබුණි | 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දේපල පිරියත උපකරණ වටිනාකම රු.2,100,000 ලෙස පෙන්වා ඇති බව හා ඒ තුළ රු.945,464 ක වත්කම් අගයෙන් රු.700,000 වත්කම අඩංගු බවත්, ඉතිරි වූ අගය ගිණුම් ගත වී නොමැති බැවින් ඒවා 2021 වර්ෂයේ වත්කම් ලෙස ගිණුම්ගත කරන බව. | වර්ෂයතුල මිලදී ගත් මුළු වත්කම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කල යුතුවේ |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්තශාලා ඔස්සේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා අත් යන්ත්‍ර හා රෙදි පිළි නිෂ්පාදන අංශය වෙත 2020 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා අංක 439-02-03-05-2201 දරන වැය විෂය යටතේ රු.20,000,000 ක මුදලක් ලබාදී තිබුණි. ඉන්රු.15,860,200 ක මුදලක් 2020 වර්ෂයේ නොවැම්බර් මාසයේ පේෂ කර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව සහ උපකරණ මිලදීගැනීම වෙනුවෙන් වැය කර තිබුණි.එසේම වැය විෂය අංක 439-2-3-4-2202 යටතේ අත් යන්ත්‍ර හා රෙදි පිළි කර්මාන්ත වෙනුවෙන් පළාත් මට්ටමේ ක්‍රියාකාරීත්වය සඳහා වෙන් කර තිබූ රු.20,000,000 | අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩලය නොලැබීම, කොවිඩ් ව්‍යාප්තිය සිදුවිම හේතු වෙන් සති කිහිපයක් අමාත්‍යාංශය වසා තැබීම, සේවකයන්ගේ පැමිණීමද සීමා කිරිම යනාදි දුෂ්කරතා රාශියක් අතර රාජකාරි කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබූ බව හාඉදිරි වර්ෂය තුල මෙම අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හී විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම හා ඇගයීම කලයුතුවේ. |

| | | |
|---|---|---|
| ක මුදලින් මැෂින් මිලදී ගැනීම, ඌව පළාතේ හල්පේ පේෂ කර්මාන්ත මධ්‍යස්ථානය විදුලි තැත් ඇදීම සහ මොනරාගල පේෂ කර්ම අලෙවිසැල අලුත්වැඩියා කිරීම යනාදී කාර්යන් වෙනුවෙන් රු.8,838,551 ක් වැයකර තිබුණි. තවද එම කාර්යයන් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක්ද අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. | | |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15 (3)(ඇ) වගන්තිය ප්‍රකාරව හා භාණ්ඩාගාර ලේකම්ගේ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.2 ඡේදය ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන වාර්ෂික ගිණුම් සමඟ, වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය මඟින් 2020 වර්ෂය සඳහා එසේ කර නොතිබුණි. | අවශ්‍ය කාර්යමණ්ඩලය නොලැබීම, අමාත්‍යාංශය වසා තැබීම සහ කොවිඩ් වසංගතය වැනි හේතූන් නිසා සේවකයන් නොපැමිණීම තුල එම වාර්තා නිසි පරිදි ඉදිරිපත් කිරීමට නොහැකිවිය. ඉදිරි වර්ෂතුල මෙම අඩුපාඩු මගහරවා ගෙන නියමිත දිනට වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | විගණන පනත හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කලයුතුවේ. |

**3.3 ප්‍රසම්පාදනයන්**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ රු.711,580 ක් වටිනා කැමරා උපාංග හා රු.1,388,500 ක් වටිනා පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර මිලදී ගෙන තිබූ අතර, එකී මිලදී ගැනීම් සඳහාප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(අ), 2.5.1(ඇ) හා 6.3.6 (අ) යන වගන්ති වල උපදෙස් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(අ) අනුව උපකරණ මිලදී ගැනීමට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා නම් කළ නිලධාරින්ට අමාත්‍යාංශයේ අවශ්‍යතාවය සඳහා මිලදී ගැනීමට යෝජිතව තිබූ උපකරණ වල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යාංශය විසින් අනුගමනය කර නොතිබුණි | තාක්ෂණික හැකියාව පිළිබඳව නිරීක්ෂණ ලබාදීමට ප්‍රමාණවත් දැනුමක් නොතිබීම හා පැවති වසංගත තත්වය මත කාර්යාලය ක්‍රියාත්මක වූ ආකාරය නිසා වඩා වැඩි දැනුමක් ඇති නිලධාරීන් සම්බන්ධ කර ගැනීමේ ප්‍රායෝගික ගැටළු මතුවී තිබුණි.තවද මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවූයේ 2020 දෙසැම්බර් මාසයේ බැවින්එම කාලය රට තුළ කොවිඩ් -19 වසංගතය උග්‍රව පැවතිම නිසා කාර්යාලය ක්‍රියාත්මක වූයේ අවම නිලධාරීන් පිරිසක් ගෙන්වා ගැනීමෙනි. එවැනි අවස්ථා වල සමහර කරුණු ගොනුවේ සඳහන් නොවී තිබිය හැකි නමුත් මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා ප්‍රසම්පාදන කමිටුවේ සියළුම සාමාජිකයන්ගේ එකගතාවය මත සිදු වූ බව, | |
| **(ආ)** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.4 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් කළ යුතු වුවත්, මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් ඇයගේ නමද ඇතුලත්ව ප්‍රසම්පාදන කමිටුව පත්කර තිබුණි. | අංක MBHL/FIN/PRO/01 දරණ 2020.11.19 දිනැති ලිපිය මඟින් අමාත්‍යාංශ ලේකම්තුමියගේ අත්සනින් යුතුව වැඩසැපයුම් හා සේවා සඳහා ප්‍රසම්පාදන කමිටුව පත් කර ඇති බව | මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් කළ යුතුවේ. |
| **(ඇ)** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 (අ) ප්‍රකාරව ලංසු කැඳවීම් ආරාධනයට ප්‍රතිචාර වශයෙන්, අර්පණය කිරීමට ඇති භාණ්ඩ හෝ සේවා හෝ වැඩ සඳහා ලංසු සූදානම් කිරීමට ලංසුකරුවෙකුට අවශ්‍ය වන සියලු තොරතුරු, ලංසු කැඳවීමේ ලේඛනවල අන්තර්ගත විය යුතු වුවත් , රු1,388.500 ක් වූ පරිගණක මිලදී ගැනීම සඳහා එසේ ලංසු ලේඛන පිළියෙල කර නොතිබුණි. | උපකරණ යන්ත්‍ර මිලදී ගැනීමට අවශ්‍ය ලංසු ලේඛණ වල අත්‍යවශ්‍ය කරුණු අන්තර්ගතව ඇති බව | මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු සූදානම් කිරීමට ලංසුකරුවෙකුට අවශ්‍ය වන සියලු තොරතුරු, ලංසු කැඳවීමේ ලේඛනවල අන්තර්ගත විය යුතුවේ. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ ධාවන කටයුතු සඳහා යොදවා ඇති වාහන 11 ක් සඳහා වර්ෂය තුළ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් වැය විෂය යටතේ රු.798,340 ක් ද වාහන නඩත්තු වියදම් වැය විෂය යටතේ රු.1,005,103 ක් ලෙස එකතුව රු.1,803,443 ක් වූ මුදලක් වැය කර තිබුණි. අයවැය චක්‍රලේඛ අංක 06/2020 ප්‍රකාරව මෙම වාහන වල අයිතිය පවරාගෙන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශ වලට ඇතුළත් කර නොතිබුණි. | මෙම අමාත්‍යාංශය 2020.08.13 වන දින පිහිටවූ නව අමාත්‍යාංශයක් බවත් ගරු අමාත්‍යතුමාගේ සහ අමාත්‍යාංශයේ රාජකාරි සඳහා මෙම වාහන යොදා ගන්නා නිසා වැය විෂය අංක 2003 හා 1301 යටතේ වැය දරා විවිධ අලුත් වැඩියාවන් සහ වෙනත් පුනරාවර්තන වියදම් දරා ඇත. මෙම වාහනවල අයිතිය පවරා ගැනීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කරන බව | චක්‍රලේඛයප්‍රකාරව මෙම වාහන වල අයිතිය පවරාගෙන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශ වලට ඇතුළත් කල යුතුවේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු විසි දෙකක් සඳහා සේවක සංඛ්‍යාව 62 ක් අනුමත කර තිබූ අතර, විගණිත දින වූ 2021 මාර්තු 10 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 29 ක් වූයෙන් තනතුරු 11 ක් සඳහා සේවකයන් 33 පුරප්පාඩු පැවති අතර, ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටම යටතේ වූ සහකාර ලේකම් අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 02 ක්, ගණකාධිකාරී සහ අභ්‍යන්තර විගණන තනතුරු වල පුරප්පාඩු පැවතුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිළිබඳ රාජ්‍ය සේවා පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය වෙත වරින් වර දැනුම් දී ඇති නමුත් නිලධාරි හිගය නිසා මෙම අමාත්‍යාංශය වෙත මේ වන තෙක් එම පුරප්පාඩු සඳහා නිලධාරීන් ලැබී නොමැති බව හා තනතුරු වල පුරප්පාඩු සඳහා ඉදිරියේදී නිලධාරීන් ලබා දෙන බවට රාජ්‍ය සේවා පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය එකඟතාවය පල කර ඇති බව. | ආයතනයේ අරමුණු නොපිරිහෙලා ඉටු කිරීම සඳහා අනුමත සහ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට ඉහළ කළමනාකරණය ක්‍රියා කළ යුතුවේ. |